මක්සිම් ගෝර්කි

දාන්කෝගේ දැල්වෙන හදවත

ලෝපතළ මහා රුසියානු ගත්කතුවර මක්සිම් ගෝර්කි (1868-1936) විසින් යොවුන් පාඨකයින් උදෙසා ලියන ලද අතිරමණීය කතා පෙළෙන්, දාන්කෝ පිළිබඳ පුරාවෘත්තය ඉස්මතුව පෙනෙනුයේ වඩාත්ම චමත්කාරජනක කතාවක් ලෙසිනි. ගෝර්කි ලියූ 'ඉසෙර්ගීල් මැහැල්ල' නමැති කතාවේ තුන් වැනි කොටස සමන්විත වනුයේ මෙම පුරාවෘත්තයෙනි. දාන්කෝගේ චරිතය විචාරකයින් විසින් මෝසස්, ප්‍රමෙතියස් හා යේසුස් වහන්සේ වැනි චරිත හා සසඳනු ලැබේ. දාන්කෝ යන නාමය බිහිකරගෙන තිබෙනුයේ රුසියානු බසින් මතු නොව අභිගුණ්ඨික බසින් පවා 'පඬුර', 'දානය', 'දීම', 'දෙන තැනැත්තා' යන අරුතින් බව පිළිගැනීමයි. මෙම පුරාවෘත්තයේ එන අභිමානවත් වීරවරයාගේ මුවින් පිටවන වැදගත්ම වදන් පෙළ මුළු කතාවේම සාරය සම්පිණ්ඩනය කරයි : **"මිනිසුන් උදෙසා මා විසින් කළ යුතු වන්නේ කුමක්ද ?"**

මක්සිම් ගෝර්කි

දාන්කෝගේ දැල්වෙන හදවත

පරිවර්තනය

රන්ජන දේවමිත්‍ර සේනාසිංහ

චිත්‍ර

වී. කේ. බිසෙන්ගලීයෙව්



Kanol

බොහෝම ඉස්සර එකමත් එක කාලෙක මහ පොළොවේ ජීවත් වුණේ මිනිස්සු විතරයි. මේ මිනිස්සු එහා මෙහා යන්න බැරි තරමේ මහා ගන කැලෑවකට තුන් පැත්තකින් ම මැදි වෙලා හිටියා. හතරවන පැත්තේ තිබුණේ තැනි බිමක්. මේ මිනිස්සු හොඳ හයිහත්තිය තිබුණු අය. ඒ වගේ ම ඔවුන් විනෝදයෙන් ජීවත් වුණා. ඊටත් වඩා ඔවුන් බොහොම එඩිතර පිරිසක් වුණා.





කොහොම වුණත් එක දවසක් දා ඔවුන්ට මහා ඇබැද්දියකට මුහුණ පාන්න සිදු වුණා. ඔවුන්ට බොහෝම නරක කාලයක් උදා වුණා. කොහේදෝ ඉඳලා වෙනත් ගෝත්‍රිකයෝ පිරිසක් ඇවිත් පහරදීලා මොවුන් අර මහා වනාන්තරය මැදට පලවා හැරියා.





ඒක අවුරුදු දස දහස් ගණනක් පැරණි මහා ඝන වනාන්තරයක්. ඒ වනයේ රූස්ස ගස්වල අතු එකිනෙකට පැටලිලා හිරු එළිය නොවැටෙන තරමට වියනක් වගේ හැදිලා තිබුණා. ඒ වියන හරහා අහසක ඡායාවක්වත් දැක ගන්න පුළුවන් වුණේ නෑ. එහෙත් තැන් තැන්වලින් බේරී ගලන හිරු රැස් වනය ඇතුළේ තිබුණු වගුරුවලට වැටුණම මහා දුගඳක් හමන්නට වුණා. ඒ දුගඳින් මිනිස්සු එකිනෙකා මියගියා. එතකොට ඒ අයගේ අඹු දරුවෝ දුකින් වැලපෙන්නට වුණා. කිසිවක් කර කියා ගන්න බැරිවුණු පියවරු කනස්සල්ලෙන් කල්පනා කරන්න පටන් ගත්තා. මේ ව්‍යසනයෙන් මිදෙන්න නම් කෙසේ හෝ මේ වනයෙන් එළියට යන්න ඕනැයි කියලා ඔවුන් අධිෂ්ඨාන කර ගත්තා. ඒ අරමුණ ජයගන්න මාර්ග දෙකක් තිබුණා. එයින් පළමු මාර්ගය වුණේ ආපසු තැනි බිම කරා යෑමයි. ඒ වුණත් දැන් එතැන ඉන්නේ මහා බලවත්, නපුරු හතුරන්. දෙවන මාර්ගය නම් වනාන්තරය හරහා ඉදිරියට ගමන් කිරීමයි. එහෙත් ඒ වනාන්තරයේ තිබුණු යෝධ ගස්වල අතු අතුරු සිදුරු නැතිව එකිනෙකට පැටලිලා. ඒවායේ මුල්වල ගැට වැටිලා. ඒ මුල් ගැඹුරු වගුරේ රොන් මඩ තදින් බදාගෙන ඉන්නවා වගෙයි.

ගල් කඳු වගේ පේන මේ විශාල ගස් දහවල් කාලයේ දී බැදි අඳුරේ නිහඬ ව නිසොල්මන් ව සිටගෙන හිටියා. ඒත් රෑට මිනිස්සු ගිනි ගොඩවල් දල්වන්නට පටන් ගත් හැටියේ මේ ගස් මිනිසුන් වටේ තාප්පයක් ගැහුවා වගේ රොක් වුණා. දවල් ද රෑ ද කියා නැතිව මේ මිනිස්සු හැම විට ම දැඩි අඳුරු වළල්ලකින් වෙළී හිටියා. ඒ අඳුරු වළල්ල මේ මිනිසුන් තලා දැමීමට සැරසෙන්නා වගේ හාත්පසින් වටකරගෙන සිටියා. මේ මිනිසුන් එළිමහන් තැන්නට හුරු පුරුදු වී සිටි අයයි. වනයේ රූස්ස තුරු මුදුන් සිසාරා සුළං හමනා විට ඇතිවුණේ භයංකර හැඟීමක්. එතකොට මුළු වනාන්තරය ම අපැහැදිලි නොතේරෙන භාෂාවකින් ගෝරණාඩු කළේ මේ මිනිසුන්ට තර්ජනය කරන්නට වගේ. ඒ හඬ මළබෙර වාදනය කරන්නාක් වගේ වුණා.



මේ මිනිසුන් හොඳ ශක්ති සම්පන්න අය. ඒ නිසා තමන් පරාජයට පත් කළ තම සතුරන් එක්ක ඔවුන්ට මිය යන තෙක් ම වුණත් සටන් කරන්න පුළුවන්කම තිබුණා. ඒ වුණත් ඔවුන්ට එසේ මියයෑමට පුළුවන්කමක් තිබුණේ නෑ. ඒකට හේතුව වුණේ ඔවුන් වෙනත් කිසිවකු නොදන්නා රහස් රැසක් රැකගෙන සිටි නිසා. ඔවුන් ජීවිතක්ෂයට පත් වුවොත් ඒත් එක්ක ම ඒ රහස් ද වැළලීයනු ඒකාන්තයි. ඒ නිසා වනයේ විෂ දුගඳෙහි ගැලී එහි අපැහැදිලි ඝෝෂාවට යටපත්ව රෑ නිදි වරා ගෙන වාඩි වෙලා ඔවුන් කල්පනා කළා. ඔවුන් ඒ ආකාරයට වාඩි වී සිටි අතරවාරයේ ගිනි මැලයේ එළියෙන් උපන් සෙවණැලි ගස්වලට වැටිලා ඔවුන් වටා උඩ පනිමින් නිහඬ නැටුමක යෙදුණා. ඒ නිසා එය සෙවණැලි නටන්නාක් වගේ නොවෙයි, වනයට හා වගුරට අරක්ගත් භූතයින් හොල්මන් කරන්නාක් වගේ පෙනුණා. මේ මිනිස්සු වාඩි වෙලා දිගට ම කල්පනා කරමින් හිටියා. ඔවුන්ගේ සිතත් කයත් දෙක ම විඩාවට පත් කළේ කනස්සලු සිතිවිලි මිස වෙනත් දෙයක් නොවෙයි. ඔවුන් මේ වෙනකොට හිටියේ හිතින් හොඳට ම දුර්වල වෙලා. ඔවුන් අතර බිය ඉපදුණා. ඒ බිය ඔවුන්ගේ ශක්තිමක් දෑත් බැඳ දමන්නට සමත් වුණා. දුර්ගන්ධයෙන් මියගියවුන්ගේ මළමිනී ළඟත් බියෙන් බැඳ දැමුණු ජීවත් ව සිටින අයගේ අනාගත ඉරණම ගැනත් හිත හිතා හඬා වැටුණු ගැහැනුන් දුටුවම ඇතිවුණේ සංත්‍රාසයක්. පළමුව කොඳුරන්නා වාගේ ඇසුණු මේ බියපත් මිනිසුන්ගේ හඬ ටිකෙන් ටික වැඩි වී ඝෝෂාවක් බවට හැරුණා. මේ වන විට ඔවුන් මරණයට බිය වී සිටියා. ඒ නිසා තමන්ගේ සතුරන්ගේ වහලුන් බවට පත් වෙලා තමන්ගේ නිදහස පූජා කරන්න වුණත් ඔවුන් දැන් ලැජ්ජා වූයේ නැහැ. ඒ වගේ ම මේ වෙනකොට ඔවුන් කැමැත්තෙන් හිටියා සතුරන් අභිමුවට පවා යෑමට. එහෙත් මේ අවස්ථාවේ දාන්කෝ නම් වීරයෙක් ඉදිරියට ඇවිත් මේ දුර්මුඛ ව හිටි මිනිසුන් ඔවුන් පත්ව සිටි විපතින් තනිව ම මුදා ගත්තා.



දාන්කෝ කියන්නේ ඔවුන් අතරෙ ම හිටිය කඩවසම් තරුණයෙක්. කඩවසම් රූපයෙන් යුතු අය හැමදා එඩිතර ගති පා කටයුතු කරන බව හැමෝම දන්නවා. දාන්කෝ තමන්ගේ සගයින් ඉදිරියට ඇවිත් මෙහෙම කිව්වා: "අපි ඉදිරියේ තියනවා බාධාවන් මහත් රාශියක්. ඒ වුණත් ඒවා ගැන හිත හිත ඉඳලා මදි. අපි ඒ බාධාවන් ජයගන්න කිසිම දෙයක් කරන්න උනන්දු වෙන්නෙ නැතිනම් අපිට කිසිම දෙයක් දිනාගන්න ලැබෙන්නෙත් නෑ. අපි අපේ සියලු ශක්තිය ඔහේ කල්පනා කරන්නයි කනගාටු වෙන්නයි විතරක් නැති කර දමනවා. ඒකෙන් ඇති ප්‍රයෝජනය මොකක්ද ? නැගිටිමු. අපි කැලේ මැද්දෙන් කැලේ ඉවරවෙනතුරු යමු. කොහේක හරි මේ කැලේ කෙළවරක් තියෙන්නත් එපායැ. මේ ලෝකෙ තියෙන හැම දෙයකට ම කෙළවරක්, අවසානයක් තියෙනවා. නැගිටිමු, යමු."

හැම දෙනාම දාන්කෝ දිහා බැලුවා. ඔහුගේ දෑස්වල මහා බලයකුත් ජීවමාන ගින්නකුත් දැල්වුණා. තමන් අතර සිටින ඉතාම හොඳ තැනැත්තා, තමන් මේ විපතින් බේරා ගැනීමට සමත් පුද්ගලයා දාන්කෝ බව ඔවුන්ට වැටහී ගියා.

"නුඹ අප රැගෙන පලයන්, අපට මාර්ගය කියා දීපන්" කියලා ඔවුන් කිව්වා.

ඔවුන්ගේ ඒ ඉල්ලීමට සවන් දුන් දාන්කෝ ඔවුන්ගේ පෙරමුණ අරගෙන අලුත් මාවතක් සොයා ගමන් ඇරඹුවා. හැම දෙනා ම එකමුතු ව ඔහුගේ පිටුපසින් ගමන් කළා. හැමෝම ඔහු කෙරේ විශ්වාසය තැබුවා. ඒ වුණත් ඒ ගමන බොහෝ ම දුෂ්කර වුණා. හැම තැනම අන්ධකාරයේ වෙළී තිබුණා. ඒ මිනිසුන් තබන පියවරක් පියවරක් පාසා මහා වගුර තමන්ගේ කෲරතර කුණු මුඛය විවර කරලා මිනිසුන් එකිනෙකා ගිල දැමුවා. මහා ගස් මහා පවුරක් වගේ මොවුන්ගේ ගමන් මාර්ගය අවහිර කරගෙන හිටියා. ඒ ගස්වල අතු එකිනෙකට පැටලී තිබුණා, මුල් හැමතැනම ඇදී ගොස් තිබුණේ හරියට සර්පයින් වගේ. ඒ නිසා තබන තබන පියවරක් පාසා ඔවුන් දහඩිය හා ලේ ගංගා වැගිරුවා. මේ විදියට ඔවුන්ට බොහෝ කාලයක් ගමන් කරන්න සිදු වුණා. ඒත් වනාන්තරයේ කෙළවරක් දකින්න තිබුණේ නෑ. ඒ වෙනුවට එන්න එන්න ම වනාන්තරය දැඩි වුණා. ඒත් මිනිසුන්ගේ ශක්තිය එන්න එන්න ම දුර්වල වුණා. එතකොට මිනිස්සු දාන්කෝට විරුද්ධ ව කෑගාන්න වුණා. අද්දැකීම් නැති තරුණයකු වන දාන්කෝ හැමදෙනාම වනයේ අතරමං කරදාලයි කියලා ඔවුන් දොස් කියන්න පටන් ගත්තා.





දවසක් දා වනාන්තරයට උඩින් අහසේ අකුණු පුපුරණ හඬ ඇහුණා. අපැහැදිලි බියකරු හඬකින් ගහකොළ කෙඳිරි ගෑවා. එතකොට වනාන්තරය කෙතරම් අඳුරු වුණා ද කීවොත් මේ ලෝකය පහළ වූ දා පටන් ගෙවී ගිය රාත්‍රී සියල්ල එදා දවසේ එකට එක් වුණා වගේ කළුවරක් ඇති වුණා. මේ වනයේ රූස්ස ගස් එක්ක බලනකොට මේ මිනිස්සු බොහෝම පොඩියටයි පෙනුණේ. ඒ මිනිස්සු බියකරු හෙණ හඬ මැද්දෙන් තව තවත් ඉදිරියට ගියා. මේ යෝධ ගහකොළ ඒ මේ අත වැනි වැනී 'කිරි කිරි' හඬ නැගුවා, රෞද්‍ර තාල වාදනය කළා. වනය මුදුනින් අකුණු ඇඳී ඒ සැනින් ම මැකී ගියා. ඒ අකුණු එක මොහොතකට මහ වනය සිසිල් නිල් ගින්නකින් ආලෝකමත් කළා. මිනිසුන් බිය ගැන්වූ මේ අකුණු සර, පැන නැගී තරම් ම වේගයෙන් මැකී ගියා. අකුණුවල මේ සිහිල් ගින්නෙන් ආලෝකමත් වූ ගහකොළ ගන දැළක් වගේ එකට බැඳුණු තමන්ගේ රළු, දිග දෑත්වලින් මේ අඳුරු සිරගෙයින් මිදී යන මිනිසුන් නැවැත්වීමට උත්සාහ කළා. මේ අතුවල අන්ධකාරය හරහා ගමන් කළ මිනිසුන් දෙස භයංකර, අඳුරු, ශීතල කිසියම් අදිසි බලවේගයක් තමන්ගේ දෑස් යොමා බලාගෙන හිටියා.

මේ ගමන බොහෝම දුෂ්කර වුණා. එයින් විඩාවට පත් මිනිස්සු මනසින් ඇද වැටුණා. ඒත් තමන්ගේ ශක්තිය හීන වන බව පිළිගැනීමට ඔවුන් කැමති වුණේ නෑ. එය ලැජ්ජාවට කාරණයක් වුණා. ඒ නිසා ඔවුන් තමන් කැඳවාගෙන යන දාන්කෝට කෝපයෙන්, ක්‍රෝධයෙන් බැන වැදුණා. තමන් වනයෙන් මුදවාගන්න දාන්කෝට බැරි බව කියමින් ඔවුන් දොස් පැවරුවා.

වෙව්ලුම්කන ගන අන්ධකාරයේ වෙළී තිබුණු වනාන්තරය ජය ගී ගායනා කළා. විඩාවට පත් මිනිස්සු ඒ මැද නතරවෙලා දාන්කෝට කෝපයෙන් දොස් පවරන්න පටන් ගත්තා.

"උඹ කිසි දෙයක් හරියට කරගන්න බැරි කාලකන්නියෙක්. බැලුවම උඹයි අපේ විනාශකාරයා. උඹ අපට පාර පෙන්නනවා කියලා අප විඩාවට පත් කරලා අතරමං කළා විතරයි. ඒකට දැන් උඹට වන්දි ගෙවන්න සිදු වේවි. උඹ දැන් මරණයට ලෑස්ති වෙයන්" කියලා ඔවුන් කිව්වා.

දාන්කෝ පපුව ඉදිරියට පාලා ඔවුන් ඉදිරියේ හිටගෙන මෙහෙම කිව්වා. "උඹලා කිව්වා මට පෙරමුණ අරගෙන යන්නයි කියලා. ඒක නිසා මං උඹලා රැගෙන ආවා. උඹලාට නායකත්වය දෙන්න තරම් එඩිතරකමක් මා ළඟ තියෙනවා. අන්න ඒකයි මං උඹලව එක්කාගෙන ආවේ. ඒත් උඹලා ? උඹලා මොනවද කෙරුවෙ ? උඹලා නිකම් ඇවිද්දා විතරයි. දිග ගමනක් යන්න ශක්තිය ඉතුරු කර ගන්න උඹලා දැනගෙන හිටියේ නෑ. උඹලා නිකම්ම ඇවිදගෙන ආවා. ආවෙ හරියට එළු රැළක් වගේ."

ඒ වුණාත් ඒ වචන අහපු මිනිස්සු තවත් කෝපයට පත් වුණා.

"මූ මරා දාපියව්, මූ මරා දාපියව්" කියලා ඒ අය බෙරිහන් දුන්නා.

මේ මිනිසුන්ගේ කෑ ගැසීම් හඬ දෝංකාර නංවමින් වනය තව තවත් හඬ දුන්නා. අකුණු සර, අන්ධකාරය කෑලි කෑලිවලට ඉරා දැම්මා. දාන්කෝ මෙතෙක් වේලා කැපවුණේ මේ මිනිසුන් මහා වනයෙන් මුදා ගැනීමටයි. ඒත් දැන් ඒ මිනිසුන් දිහා බැලූ දාන්කෝ ඔවුන් දුටුවේ හරියට වන මෘගයින් වගේ. දාන්කෝ වටේට ම මිනිසුන් කැලක් හිටගෙන හිටියා. ඒත් ඒ කිසිම කෙනෙකුගේ මුහුණුවල උදාරත්වයක් පෙනුණේ නෑ. ඒ නිසා ඒ මිනිසුන්ගෙන් සමාවක් ලැබෙනු ඇතැයි කියලා ඔහුට විශ්වාසයක් ඇති වුණෙත් නෑ.





ඒ මොහොතේ ඔහුගේ හදවතේ මහා කෝපයක් හටගත්තා. ඒත් මිනිසුන් කෙරේ වූ අනුකම්පාව නිසා ඒ කෝපය නිවී ගියා. දාන්කෝ මිනිසුන්ට ආදරය කළා. තමා නැතිවුවහොත් මේ මිනිසුන්ටත් නිසැකව ම මරණය උරුම වනු ඇති බව ඔහු දැනගෙන හිටියා. ඒ මොහොතේ මේ මිනිසුන් මුදා ගැනීමේත් ඔවුන් වඩාත් ලිහිල් මාවතකට රැගෙන ඒමේත් අධිෂ්ඨාන ගින්නෙන් ඔහුගේ හදවත දැල්වෙන්න පටන් ගත්තා. ඒ මොහොතේ ම ඔහුගේ දෑස්වලත් බලසම්පන්න ගිනිසිළු බැබලෙන්න පටන් ගත්තා. මිනිස්සු මේ බව දැක්කා. දාන්කෝ වියරු වැටිලයි කියලා ඔවුන් හිතුවා. ඔහු දැන් දැන් තමන් හා සටනට එළඹෙනු ඇතැයි කියලා හිතපු මිනිස්සු වෘක රැළක් වගේ කන් අයාගෙන දාන්කෝ වට කරන්න පටන් ගත්තා. එහෙම කළේ වඩාත් පහසුවෙන් දාන්කෝ මරාදාන්න හිතාගෙනයි. දාන්කෝ මේ මිනිසුන් සැරසෙන්නේ කුමක් කරන්න ද යන වග වහා වහා අවබෝධ කර ගත්තා. ඒ නිසා ඔහුගේ හදවත වඩ වඩාත් දීප්තිමත් ව දැල්වෙන්න වුණා. ඒකට හේතු වුණේ මේ මිනිසුන්ගේ දුෂ්ට සිතිවිල්ල නිසා දාන්කෝගේ කණගාටුව දෙගුණ තෙගුණ වීමයි.

වනාන්තරය තාමත් තමන්ගේ මූසල අඳෝනාව නගමින් හිටියා. අකුණු පුපුරමින් තිබුණා. දිගටම වැසි ඇද හැලුණා...

"මුන් බේරගන්න මං මොනවා කරන්නදෝ ?" කියලා දාන්කෝ හෙණ හඬ පරයන හඬින් කෑගෑවා.

ඒත් එක්කම දාන්කෝ අතින් පපුව ඉරා විවර කරලා තමන්ගේ හදවත ඉන් කඩා ඉවතට ගෙන හිසට උඩින් ඉහළට එසවූවා.

ඒ හදවත හිරු මෙන් දීප්තිමත් ව බැබලුණා. හිරුටත් වඩා ප්‍රභාමත් වුණා. මිනිසුන් කෙරේ පානා මහා ප්‍රේමයේ මේ ගිනි හුළෙන් ආලෝකමත් වූ මුළු වනාන්තරයම නිශ්ශබ්ද වුණා. ඒ එළියට බියපත් වූ අන්ධකාරය නොයෙක් අත පලාගොස් වනය මැද තනිවී වෙව්ල වෙව්ලා සිට දුගඳ හමන වගුරු මුඛයට වැටුණා. මවිතයට පත් මිනිස්සු ගල් ගැසුණා.

"යමාව්" යැයි කෑ ගැසූ දාන්කෝ දැල්වෙන තම හදවත උස්සාගෙන එයින් මිනිසුන්ට මාර්ගය ආලෝකවත් කරමින් තමන්ට හිමි තැන ගැනීමට ඉදිරියට දිව ගියා.

එයින් වශී වී ගිය මිනිස්සු දාන්කෝ පසුපස දිව ගියා. එවිට පුදුම සහගත ලෙස ගස් මුදුන් අඹරවමින් වනය නැවත ඝෝෂා කිරිමට පටන් ගත්තත් දිව යන මිනිසුන්ගේ පා ගැටෙන හඬින් ඒ ඝෝෂාව යටපත් වී ගියා. දැල්වෙන හදවතේ ආශ්චර්යමත් දසුනෙන් විමතියට පත් සෑම දෙනා ම එඩිතර සිතින් වේගයෙන් දිවගියා. එහෙම දුවද්දිත් මිනිස්සු මියගියා. ඒත් ඔවුන් මිය ගියේ දුක්ගැනවිලි නඟමින් හෝ කඳුළු සලමින් හෝ නොවෙයි. දැනුත් පෙරමුණේ හිටියෙ දාන්කෝ. ඔහුගේ හදවත තවමත් දැල්වෙමින් තිබුණා.

එක්වරම වනය ඔවුන් ඉදිරියෙන් ඈත් වී ගියා. ඒ ගන, ගොළු වනය ඔවුන් පිටුපස පිහිටියා. දාන්කෝත් ඔහු පසුපස ආ පිරිසත් සේන්දු වී සිටියේ වර්ෂාවෙන් සේදුණු හිරු එළියෙන් නැහැවුණු පිරිසිදු වාතයෙන් පිරිගත් තැන්නකටයි. ඔවුන් පිටුපස පිහිටි වනයේ තවමත් අකුණු පුපුරමින් තිබුණා. ඒත් මේ තැන්න හිරු එළියෙන් බැබළුණා. මුතු ඇට වගේ පිණිබිඳුවල ඇඳුණු තණපත් බැබළුණා. ගංගාව රත්තරනින් දිලිසුණා. තැන්න සැනසුම් සුසුම්ලෑවා...දසත සුළං හමා ගියා. ගිනි පාටට හැරුණු බැස යන හිරුගේ එළිය වැටුණු නදිය, දාන්කෝගේ ඉරා දමන ලද පපුවෙන් ගලා ගිය ලේ දහරාව වගේ රතු පාටට දිස් වුණා.

එඩිතර, උදාර දාන්කෝ පුළුල් මිටියාවත දිහා පෙරබැලුම් හෙළුවා. ප්‍රීතියෙන් මේ නිදහසේ භූමිය දෙස බැලූ දාන්කෝ ආඩම්බරයෙන් සිනහසුණා. පස්සෙ බිම ඇද වැටුණු ඔහු මිය ගියා.

සතුටට පත් වුණු, බලාපොරොත්තුවලින් පිරී ගිය මිනිස්සු දාන්කෝ මිය යන හැටි දැක්කේ නැහැ. එපමණක් නොවෙයි දාන්කෝගේ දේහය අසල ඔහුගේ එඩිතර හදවත තවම දැල්වෙමින් තිබෙන බවත් ඔවුන් දැක්කේ නැහැ. ඒත් ඒ දුටු එක් ප්‍රවේසම් සහගත තැනැත්තෙක් කුමකටදෝ බියෙන් එම උදාර හදවත පයින් පාගා දැම්මා...එය ගිනිපුලිඟු විසුරුවා නිවී ගියා.





ඒ උදාර දාන්කෝ පිළිබඳ මතකය සිහියට නඟමින්, වැසි වසින්නට පෙර අකුණු ගහන්න පටන්ගන්නකොට ස්ටෙප් මිටියාවතේ අදටත් නිල් පාට පුලිඟු ඇතිවෙනවා.





මැක්සිම් ගෝර්කි
යෙව්සෙයිකාගේ ජලෙවන ගමන

Kanol Publishing House
1196/4, Kottawa Road, Pannipitiya
Tel: 011 4336778, 011 4336779
ISBN 978-955-1979-44-7

© Ranjana Senasinghe

Layout
Malaka Lalanajeewa
Printed by
Yasaisuru Printers

Rs. 200/-